**ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 322 - ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 506 (ඇ) ප්‍රකාරව ඉදිරිපත් කර තිබූ සැසැදුම් ප්‍රකාශය අනුව අවම ලැබීම් සීමාව රු.22,000,000 ලෙස දක්වා තිබුණද, වාර්ෂික විසර්ජන පනත අනුව එම සීමාව රු.22,200,000 කි. ඒ අනුව සැසඳුම් ප්‍රකාශයේ අවම ලැබීම් සීමාව සහ වාර්ෂික විසර්ජන පනතේ අවම ලැබීම් සීමාව අතර රු.200,000 ක වෙනසක් පැවතුණි. | නිවැරදි කරන ලද මු.රෙ. 506(ඩී) ප්‍රකාර රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම පිළියෙල කර ඉදිරිපත් කරන බව. | සැසඳුම් ප්‍රකාශය තුළ සීමාවන් නිවැරදිව දැක්විය යුතුය. |

**(ආ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| i. | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.7,727,804,451 ක් වූ මූල්‍ය නොවන වත්කම්වල අවසාන ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය තුල ආරම්භක ශේෂය ලෙස දක්වා නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් වල ආරම්භක ශේෂයට එකතු කිරීම් ලෙස සටහන් කර ඇත. | ගිණුම් ශේෂ නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| ii. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වලට අදාළ කෙරීගෙන යන වැඩවල වටිනාකම හා අපහරණය කිරීම් පිළිබඳ කිසිඳු ගැලපීමක් මූල්‍ය නොවන වත්කම් වලට අදාළ භාණ්ඩාගාර මුද්‍රිත SA 82 තුල ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් ගිණුම නිවැරදිව ගිණුම් ගත කිරීමෙන් පසු 2023 වර්ෂයේ සිට අදාළ ගැලපීම් නිවැරදිව සිදු කිරීමට සටහන් කර ගත් බව. | ගිණුම් ශේෂ නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| iii. | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනයේ වැඩ සටහන් අනුව වියදම් ප්‍රකාශය ඒසීඒ - 2 (i) අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු. 21,525,173 ක් පැවතුණද සිගාස් වැඩසටහන යටතේ SA 82 ආකෘතියේ වර්ෂයේ මිලදී ගැනීම් දක්වා නොතිබුණි. | 2023 වර්ෂයේදී වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට සටහන් කර ගත් බව. | වර්ෂය තුල අත්පත් කරගත් වත්කම් ගිණුම් ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව එක් එක් වැය විෂයයන් වෙනුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැරකම් හා බැඳීම්වලට එළැඹිය නොහැකි වුවද, වැය විෂයයන් 03 ක ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.1,968,451 ක බැරකම් වලට එළඹ තිබුණි. | ඉදිරියේදී මෙම අඩුපාඩු මගහරවා ගෙන කටයුතු කරන බව. | අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා කටයුතු නොකල යුතුය. |

### 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන් දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත් ,එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත් ,එවැනි සමාලෝචනයක් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ තොරතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දැදුරු ඔයේ සිට ගනේවත්ත ඖෂධ උද්‍යානය දක්වා ජල සැපයුමක් ලබා ගැනීම වෙනුවෙන් අවබෝධතා ගිවිසුමක් රහිතව වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල අවස්ථා 03 කදී රු. 18,581,000 ක් ගෙවා තිබුණු අතර අදාල කටයුතු වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රු. 1,323,623 ක් 2021 දෙසැම්බර් 16 දින ගෙවා තිබුණි. එසේ වුවද මෙම ව්‍යාපෘතියේ කටයුතු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් වන විටත් අවසන් කර නොතිබුණි. | මේ වන විට ව්‍යාපෘතියේ කටයුතු අවසන් අදියරේ පවතින බවත් 2020, 2021 හා 2022 වර්ෂ වල පැවති කොරෝනා වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුදය හේතුවෙන් රට වසා තැබීම, ආනයනික භාණ්ඩ සීමා වීම ආදී කරුණු නිසා ප්‍රමාදයක් සිදුවූ බව. | ව්‍යාපෘති අදාල කාලය තුල නිම කළ යුතු වීම. |

## 3.2 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ වැසිකිලි පද්ධතිය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව තුල පිරිවැය ඇස්තමේන්තු කළ හැකි වහළය සවි කිරීම, යකඩ ගේට්ටු හා බිම් උළු ඇල්ලීම සම්බන්ධ වැඩ විෂයයන් 06 ක් සඳහා රු.970,000 ක Provisional sum වටිනාකම් ඇතුළත් කර ඉන් Provisional sum 04 ක් සඳහා ගිවිසුම්ගත වටිනාකම ඉක්මවා රු. 776,357 ක් ගෙවීම් කර තිබුණි. | ප්‍රමාණ පත්‍රයේ නිශ්චිතව හඳුනා ගත හැකි අයිතම සඳහා නිශ්චිත මිල ගණන් දක්වා ඇත. අනෙකුත් අයිතම සවි කිරීම සඳහා මිල ගණන් ඇස්තමේන්තුවට වෙනම ඇතුළත් කර ඇත. නමුත් මේ වන විට නිම කළ සියළු වැඩ කොටස් සඳහා 10% වටිනාකම ඇතුළත ගෙවීම නිර්දේශ කළ ප්‍රමාණයට අඩුවෙන් ගෙවීම් සිදු කරන ලද බව. | නිශ්චිතව හඳුනාගත හැකි වැඩ සඳහා පිරිවැය ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගනේවත්ත වන ඖෂධ උද්‍යානයේ 2016 වර්ෂයේදී රු.1,936,769 ක් වැය කර ඉදිකර තිබුණු ආපන ශාලාව 2020 පෙබරවාරි මාසයේ සිට භාවිතයකින් තොරව පැවතුණි. | ආපන ශාලාවෙන් ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවන බැවින් ගැනුම්කරු ආපනශාලාව පවත්වාගෙන යාම නවතා දමා ඇති බවත්, ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගොඩනැඟිලි ඵලදායිව උපයෝජනය කළ යුතු වීම. |
| (ආ) | 2015 දෙසැම්බර් 29 දින රු. 593,340 ක් වැය කර රාජකීය උද්භිද උද්‍යානයේ කාබනික පොහොර නිෂ්පාදනය සඳහා කැබලි කිරීමේ යන්ත්‍රයක් (Multi chopper) මිලදී ගෙන තිබුණද, අදාළ යන්ත්‍රය සවි කිරීමේ ස්ථානයක් ඉදිකර නොතිබීම හේතුවෙන් වසර 07 ක කාලයක් නිෂ්කාර්යයව පැවතුණි. | 2024 වර්ෂයේ කාබනික පොහොර අංගනයේ නවීකරණ කටයුතු සිදු කිරීමෙන් පසුව මෙම උපකරණය භාවිතා කිරීමට අදහස් කරන බව. | අදාළ යන්ත්‍රය අරමුණුගත කාර්ය සඳහා යොදවා ගත යුතු වීම. |
| (ඇ) | 2019 වර්ෂයේ රාජකීය උද්භිද උද්‍යානයේ ඉදි කිරීමට සැලසුම් කර තිබුණු ආපන ශාලාව සඳහා රු. 547,432 ක පුටු 130 ක් හා රු. 237,000 ක මේස 30 ක් මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ආපනශාලාවේ ඉදි කිරීම් කටයුතු ආරම්භ නොවීම හේතුවෙන් පැරණි ආපනශාලාව සඳහා පුටු 28 ක් නිකුත් කර ඉතිරි භාණ්ඩ සියල්ල වසර 03 කට ආසන්න කාලයක් නිෂ්කාර්යයව පැවතුණි. | මෙම උපකරණ උද්‍යානයේ විවිධ අවශ්‍යතා සඳහා යොදා ගන්නා බවත්, ඉදිරියේදී මෙම පුටු අවශ්‍යතාවය පවතින වෙනත් ඒකකයක් වෙත ලබා දීමට කටයුතු කරන බව. | අවශ්‍යතාවය පිළිබඳ නිවැරදි ඇගයීමකින් පසු මිලදී ගැනීම කළ යුතු අතර ලී බඩු උපකරණ උපයෝජනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | වැලිමඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් හක්ගල උද්භිද උද්‍යානයේ ඉඩම මැනුම් කර අයිතිය පවරා ගෙන නොතිබුණි. | මෙම කොටස මැන මායිම් සලකුණු කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට රු.448,500 ක මුදලක් ගෙවා ඇති අතර, කඩිනමින් මෙම මායිම් සලකුණු කර දෙන ලෙස ඉල්ලීම කර ඇති බව. | ඉඩම මැනුම් කර අයිතිය පවරාගත යුතු වීම. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගනේවත්ත වන ඖෂධ උද්‍යානය තුල දේශන, පුහුණු වැඩ සටහන් හා වැඩමුළු පැවැත්වීමේ අරමුණින් 2017 වර්ෂයේ රු. 23,392,342 ක වියදමකින් ඉදිකර තිබුණු දෙමහල් දේශන ශාලා ගොඩනැගිල්ල තුල වසර 6 ක කාලයකදී දේශන 64 ක් පවත්වා ඇති අතර බාහිර පාර්ශවයන්ට කුලියට දීමෙන් රු. 40,500 ක ආදායමක් උපයා තිබුණි. ඒ අනුව විශාල පිරිවැයක් දරා ඉදිකරන ලද ගොඩනැගිල්ල ඌන උපයෝජිතව පැවතුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ පැවති තත්ත්වයන් හා ආර්ථික අර්බුදකාරී කාලසීමාවේ පැවති සීමාකිරීම් හේතුවෙන්ද සංවිධානය කරන ලද වැඩමුළු පවා සක්‍රිය කර ගැනීමට නොහැකි වූ බව. | අදාළ ගොඩනැඟිලි ඵලදායිව උපයෝජනය කළ යුතු වීම. |
| (ආ) | නාරාහේන්පිට සහකාර අධ්‍යක්ෂ කාර්යාලය පිහිටි ඉඩම විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොමැති අතර 2022 අගෝස්තු වන විට එම පරිශ්‍රය තුල අනවසර ඉදිකිරීමක් ද සිදු කර තිබුණි. | පවතින තත්වය යටතේ අනවසර ඉදිකිරිම ඉවත් කිරිම සඳහා නීතිමය ක්‍රියාමාර්ගයකට යොමු විම අපහසු බව. | ඉඩමේ අයිතිය පවරා ගත යුතු අතර අනවසර ඉදිකිරීම් ඉවත් කළ යුතු වීම. |
| (ඇ) | 1989 පෙබරවාරි 27 දිනැති අංක මදි/4/මල්/04/988 දරන මහනුවර දිස්ත්‍රික් ලේකම්ගේ ලිපිය අනුව පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයට පැමිණෙන වාහන නැවැත්විම සඳහා ස්ථානයක් ලෙස රාජකීය උද්භිද උද්‍යානය ඉදිරිපිට ප්‍රධාන මාර්ගයේ මැද සිට අඩි 50 ක් මාර්ග රක්ෂිතයට වෙන්කර ඉතිරි බිම් කොටස උද්‍යානයට පවරාදී තිබුණි. එම පරිශ්‍රයට අයත් භූමිය තුල බාහිර පුද්ගලයෙකු විසින් වර්ග අඩි 250 ක පමණ ගොඩනැඟිල්ලක් ඉදිකර ව්‍යාපාරයක් කරගෙන යමින් පැවතියත් එය ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | විමර්ශනයක් සිදු කර මෙම බිම් කොටසේ අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | ඉඩමේ අයිතිය පවරා ගත යුතු අතර අනවසර ඉදිකිරීම් ඉවත් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සීතාවක තෙත් කලාපීය උද්භිද උද්‍යානයට අයත් අක්කර 08 ක තේ වත්ත ඉකුත් වර්ෂයේ ජනවාරි 29 දින වසර 05 ක කාලයක් සඳහා රජයේ තක්සේරුවක් රහිතව බාහිර පුද්ගලයෙක් වෙත බදු දී තිබුණි. 2022 ජනවාරි 28 දින බදුකරු විසින් ගිවිසුම උල්ලංඝනය කිරීම මත ගිවිසුම අවලංගු කර තිබුණද හිඟව පැවති රු. 477,002 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අයකර ගත යුතු වීම. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ආයතනයට අයත් මූල්‍ය නොවන වත්කම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම් තක්සේරු කොට ගිණුම්ගත කිරීමේ කටයුතු සිදු කරගෙන යන බව. | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වීම. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියට අනුයුක්තව සිටි තනතුරු 06 කට අයත් නිළධාරීන් 12 දෙනෙකුගෙන් යුත් කාර්යමණ්ඩලයක් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර තිබුණි. ඉන් තනතුරු 02 කට අයත් නිළධාරීන් 06 දෙනෙකු සේවයේ යොදවාගෙන තිබුණද දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලයට අන්තර් ග්‍රහණය කිරීමකින් තොරව එම නිලධාරීන් වෙනුවෙන් මාසිකව රු. 335,596 ක මුදලක් වැටුප් ලෙස ගෙවමින් පැවතුණි. | දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ ඉහත සේවකයින් සංඛ්‍යාව පෙන්වා නැති බවත්, 322-02-1-1001 දරණ වැටුප් හා වේතන වැය විෂයෙන් ලබා දී ඇති ප්‍රතිපාදන යටතේ වැටුප් ගෙවීමට කටයුතු කර ඇති බව. | දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලයට අන්තර් ග්‍රහණය කිරීමට කටයුතු කළ යුතු වීම. |